**1. තනතුර - තොරතුරු තාක්ෂණ සහකාර**

**2. වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3. සුදුසුකම්**

**අ. බාහිර අයදුම්කරුවන්**

i. තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක මෘදුකාංග/දෘඩාංග ක්ෂේත්‍රයට අදාලව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන්**

ii. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**ඇ. වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4. වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - MA 2-1 2025

මූලික වැටුප - රු.46,960.00 (2026), රු.50,540.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 46,960.00+17800.00 x12 = රු. 777,120.00 (2026)

50,540.00 +17800.00 x12= රු. 820,080.00 (2027)

**5. රාජකාරී ස්වභාවය**

i. පහත දැක්වෙන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විශේෂඥතා ක්ෂේත්‍රයන්හි අදාළ කාර්යභාරයන් (කාර්යාංශයෙහි අවශ්‍යතාවය අනුව) ක්‍රියාත්මක කිරීම සඳහා සහායක කාර්යයන් ඉටු කිරීම.

| විශේෂඥතා ක්ෂේත්‍රය | විශේෂඥතා ක්ෂේත්‍රය අනුව කාර්යභාරය |
|---|---|
| තොරතුරු පද්ධති (IS) | අ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සැලසුම් කෙටුම්පත් කිරීම.<br><br>ආ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම.<br><br>ඇ. ආයතනික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් හඳුනා ගැනීම (Requirement Analysis, System Analysis) හා තොරතුරු තාක්ෂණික විසඳුම් නිර්මාණයට අදාළ මූලික කටයුතු (System Designing)<br><br>ඈ. ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඇගයීම් කටයුතු සිදු කිරීම |

| | |
|---|---|
| | ඉ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම / ඇගයීම<br><br>ඊ. කළමනාකරණ අවශ්‍යතා සඳහා තොරතුරු පද්ධති වාර්තා (MIS Reports) සැකසීම<br><br>උ. විශේෂඥතා ක්ෂේත්‍රයට අදාළ කටයුතු වෙනුවෙන් අභ්‍යන්තර / බාහිර ආයතන සමග සම්බන්ධතා පවත්වා ගැනීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. |
| තොරතුරු තාක්ෂණ (IT) | අ. හඳුනා ගත් අවශ්‍යතා සඳහා මෘදුකාංග නිර්මාණය, පරීක්ෂණය, ස්ථාපනය සහ නඩත්තු කිරීම. (Programming / Development, Testing, Implementation and Maintenance)<br><br>ආ. දත්ත සමුදාය නිර්මාණය, පරිපාලනය හා නඩත්තු කටයුතු කිරීම (Database Administration)<br><br>ඇ. නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම, යාවත්කාලීන කිරීම, පවත්වා ගෙන යාම සම්බන්ධ කටයුතු සිදු කිරීම හා ඊට අදාළ ප්‍රධාන රාජකාරි ඉටු කිරීම.<br><br>ඈ. පරිශීලක අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් මෘදුකාංග යාවත්කාලීන කිරීම.<br><br>ඉ. මෘදුකාංග හා දත්තවල සුරක්ෂිතතාව උදෙසා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.<br><br>ඊ. විශේෂඥතා ක්ෂේත්‍රයට අදාළ කටයුතු වෙනුවෙන් අභ්‍යන්තර / බාහිර ආයතන සමග සම්බන්ධතා පවත්වා ගැනීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. |
| පරිගණක ජාල/ ආරක්ෂණය (Computer Networks/Security) | අ. පරිගණක ජාල නිර්මාණය කිරීම, ජාල පරිපාලනය සහ ඒවායේ නඩත්තු කටයුතු සිදු කිරීම. (Network Administration)<br><br>ආ. පරිගණක දෘඩාංග / ජාල දෘඩාංගයන්හි නඩත්තු කටයුතු, දෝෂ අනාවරණය සහ ඒවා නිරාකරණයට අවශ්‍ය කටයුතු කිරීම.<br><br>ඇ. අන්තර්ජාල / විද්‍යුත් තැපැල් පහසුකම් සම්බන්ධ පරිපාලන කටයුතු සිදු කිරීම.<br><br>ඈ. පරිගණක ජාල, තොරතුරු පද්ධති ආරක්ෂණය සම්බන්ධ කටයුතු කිරීම සහ ඒ හා සම්බන්ධ ප්‍රධාන රාජකාරි ඉටු කිරීම. (Network Security Administration)<br><br>ඉ. විශේෂඥතා ක්ෂේත්‍රයට අදාළ කටයුතු වෙනුවෙන් අභ්‍යන්තර / බාහිර ආයතන සමග සම්බන්ධතා පවත්වා ගැනීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. |

ii. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව පවරනු ලැබිය හැකි වෙනත් කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සහායක කාර්යයන් ඉටු කිරීම.